පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - 2015

---

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව පරිත්‍යාග වත්කම්, ක්‍රමක්ෂය කළ යුතු වුවත් 2012 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ වටිනාකම රු.9,100,000 ක් වූ වෑන් රථයක් නියමිත පරිදි ක්ෂය කර තිබුණු නමුත් ක්‍රමක්ෂය කිරීම 2015 වර්ෂයට පමණක් සිදු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට වත්කමේ ධාරණ අගය රු.2,123,334 ක් වුවද එය නියෝජනය වූ පරිත්‍යාග ගිණුමේ ශේෂය රු.7,280,000 ක් ව පැවතුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ස්ථාවර තැන්පතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු පොලී රු.44,824 ක් ගිණුම් ගත කර නොතිබුණි.

#### 2.2.3 නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාල හා ලී බඩු උපකරණ සහ පොත් පත් සඟරා වල වටිනාකම සහ ස්ථාවර වත්කම් ලේඛණය අතර රු.2,896,803 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| <u>නීති රීති හා රෙගුලාසි වලට යොමුව</u> | <u>අනුකූල නොවීම්</u> |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 757(2) අ | සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද පුස්තකාල පොත් සමීක්ෂණයේ වාර්තා 2016 ජුනි 30 වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1) වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.14,347,377 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 95 | 2014 මාර්තු 26 දිනැති අංක 06/2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ ලිපියට අනුව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සංග්‍රහ වියදම් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවට වැටුප් මත සංග්‍රහ වියදම් දීමනා ලෙස රු.178,955 ක මුදලක් ගෙවා තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,971,036 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.781,671 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.6,189,365 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.3,043,320 ක් වැඩි වී තිබුණද සේවක පාරිශ්‍රමික රු.5,106,340 කින් හා වෙනත් වියදම් රු.4,008,985 කින් වැඩිවීම ඉහත ඌනතාවයන් වැඩිවීම කෙරෙහි විශේෂයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තයක් පැවති නමුත් එය ඉන් පසුව අඛණ්ඩව හා ක්‍රමිකව වර්ධනය වන ඌනතාවයක් බවට පත් වී තිබුණි. කෙසේවුවද සේවක පාරිශ්‍රමික ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු දායකත්වය ධන අගයක් ගෙන තිබූ අතර එය සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.29,817,441 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය
--------------------------

4.1 කාර්ය සාධනය
-----------------

ශිෂ්‍යයන් ඇතුළත් කර පාලි හා බෞද්ධ විෂය ක්ෂේත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි තත්ත්වයේ ඉගැන්වීම, පුහුණු වීම සහ පර්යේෂණ කිරීම සඳහා කටයුතු සැලැස්වීම, පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා නිශ්චය කිරීම සහ ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබූ තැනැත්තන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම සහ තනතුරු ඇති කිරීම, අත්හිටු වීම හෝ නැති කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණු විය.

කාර්ය සාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව ආයතනය විසින් 2015 වර්ෂය සඳහා ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු 26 ක් සහිතව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු අතර එම අරමුණුවලින් 18 ක් වර්ෂය තුළ සම්පූර්ණයෙන් නිම කර ගැනීමට හැකිව තිබුණි. දැනට ක්‍රියාකාරකම් 05 ක් නිම වෙමින් පැවති අතර ක්‍රියාකාරකම් 03 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. කෙසේ වුවද, මෙම ක්‍රියාකාරී සැලැස්ම තුළින් ළඟාකර ගැනීමට

අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳව තොරතුරු දක්වා නොතිබුණි.

(ආ) අධ්‍යයන කාර්ය සාධනය පිළිබඳව සලකා බැලීමේදී ආයතනය විසින් පවත්වන ලද පාඨමාලා 07 කට අදාළව වර්ෂ 03 ක සාරාංශගත තොරතුරු පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පසුගිය වර්ෂ දෙක හා සසඳන විට සමස්ත ශිෂ්‍ය ලියාපදිංචියේ සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් නොකෙරුණු අතර ශිෂ්‍ය ලියාපදිංචිය පාඨමාලා අනුව සසඳන විට බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් ලියාපදිංචි වී තිබුණි.

(ii) බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය (M. Phill) හා බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද (Ph.D) උපාධිය හදාරන ලද 215 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සමාලෝචිත වර්ෂයේදී උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව 06 ක් පමණක් වූ අතර මේ සඳහා අපේක්ෂකයින් බොහොමයක් රැකියා වල නියුතු කාර්ය බහුල පුද්ගලයන් වීම එම තත්ත්වයට හේතු වූ බව ආයතනය විසින් විගණනයට දන්වා තිබුණි.

(ඇ) පර්යේෂණ ආධාර සඳහා වාර්ෂික අයවැය ලේඛණය මගින් රු.650,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණද, වර්ෂය තුළ ආචාර්යවරුන් විසින් පර්යේෂණ ආධාර ඉල්ලුම් කර නොතිබුණි. වර්ෂය තුළ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 06 දෙනෙකු සඳහා රු.1,341,406 ක් පර්යේෂණ දීමනා වශයෙන් ගෙවා තිබූ අතර පර්යේෂණ පරිසංවාදයන් පවත්වා නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම ආයතනය ආරම්භයේ සිට වසර 37 ක කාලයක් කුලී ගොඩනැගිලි වල පවත්වාගෙන ගොස් තිබූ අතර ආයතනයට ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවධානය යොමු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි කුලී වශයෙන් රු.8,410,413 ක් ගෙවා තිබුණි.

(ආ) පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන අමතර පාඨමාලා 05 ක් සඳහා ලැබෙන ආදායමෙන් විවිධ රේටයන් මත රු.2,356,049 ක් ආයතනයේ සංවර්ධන අරමුදලට කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත මාරු කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද පාඨමාලා ආදායමෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.441,000 ක මුදලක් සේවකයන්ගේ පෞද්ගලික සුබ සාධනය සඳහා වූ සුබ සාධක අරමුදලකට බැර කර තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට ගබඩා අත්තිකාරම් ගිණුමේ ශේෂය හා ගබඩා ලෙජරය අනුව තොග ශේෂය අතර වෙනස රු.69,347 ක් විය. මෙය තොග ගැලපුම් ගිණුමක් ලෙස දිගින් දිගටම ගිණුම්වල පෙන්වා තිබූ අතර විධිමත් අනුමැතීන් මත තොගයට අවශ්‍ය ගැලපුම් කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------

ආයතනය විසින් 2015 සැප්තැම්බර් 01 දින අන්වේෂණ ශාස්ත්‍රීය සංග්‍රහයේ එක් පිටපතක් සඳහා රු.350.50 ක පිරිවැයක් දරමින් පිටපත් 300 ක් මුද්‍රණය කර තිබුණි. අධ්‍යක්ෂකවරයාගේ අනුමැතිය

මත එක් පිටපතක් රු.500 කට අලෙවි කිරීමට කටයුතු කර තිබුණද විගණිත දිනය වූ 2016 මාර්තු 09 දින වන විට අලෙවි වී තිබුණේ පිටපත් 38 ක් පමණි. ඉතිරි ප්‍රකාශන 217 අලෙවි කිරීම සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් යොදා නොතිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහ පාලනය
------------------------------------

5.1 අයවැය ලේඛනමය පාලනය
--------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර, සියයට 71 සිට සියයට150 දක්වාද අයවැය ගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 61 සිට සියයට 287 දක්වා ද පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් පැවතීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්
----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | <u>පද්ධති හා පාලන ක්ෂේත්‍රය</u> | | <u>නිරීක්ෂණය</u> |
|---|---|---|---|
| (අ) | ගබඩා පාලනය | - | මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ තොග ශේෂයන් හා උපයෝගී ලේඛණ අතර වෙනස්කම් පැවතීම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | - | මූල්‍ය ප්‍රකාශනයේ වටිනාකම හා ස්ථාවර වත්කම් ලේඛනයේ වටිනාකම අතර වෙනස්කම් පැවතීම. |
| | | | ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතැම් වත්කම් වල අත්පත් කර ගත් දිනය සටහන් කර නොතිබීම |
| (ඇ) | පුස්තකාල පාලනය | - | පුස්තකාල පොත් සමීක්ෂණය කර වාර්තා ඉදිරිපත් කර නොතිබීම. |
| | | | ආපසු භාර නොදුන් කල් ඉකුත් වූ පොත් පැවතීම. |
| (ඇ) | වාහන පාලනය | - | ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබීම. |